GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2016.08.03

**මාධ්‍ය නිවේදනය**

**වෛද්‍යවරුන්ගේ දෙවන භාෂා නිපුණත්වය පිළිබඳ වැඩමුලුව නැවතිම පිළිබඳ දැනුවත් කිරීම**

ශ්‍රී ලංකාවේ දැනට භාවිතා වන භාෂා වර්ග තුනකි. සිංහල, දමිළ සහ ඉංග්‍රිසි යනු එම භාෂා තුන් වර්ගයයි. නෙල්සන් මැන්ඩෙලා මහතාගේ කියමනකට අනුව ”If you talk to a man in a language he understands, that goes to his head. If you talk to him in his language, that goes to his heart”. එනම් ඔබ යමෙකු සමඟ එම පුද්ලයාට තේරෙන භාෂාවකින් කතා කරයි නම් එය ඔහුගේ ඔලුවට දැනෙන බවත්, එම පුද්ගලයාගේ හදවතට ඇමතිය යුතු නම් එම පුද්ගලයාගේ මව් භාෂාවෙන් කතාකල යුතු බවත් ඔහු පවසයි. එමෙන්ම වෛද්‍යවරයෙකුට රෝගියෙකුගේ නියම රෝගී තත්ත්වය හඳුනා ගැනිමට රෝගියාගේ මව් බසින් කතා කිරීම අත්‍යවශ්‍ය දෙයකි. ශ්‍රී ලංකාව තුල ද්වි භාෂා ප්‍රවිණත්වයේ අගය තේරුම් ගත් රජය 2007/07 චක්‍ර ලේඛය මඟින් පණ ගැන්වූ අතර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සෞඛ්‍ය අමාත්‍යංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය සමඟ එක්ව් එය ප්‍රායෝගිකව යොදවා ගැනිම තුලින් ගුණාත්මක වෛද්‍ය සේවයක් බිහි කිරීමට ගන්නා ලද උත්සාහය ප්‍රසංශනීය වෙයි. 2013 වර්ෂයේ කැබිනට් අනුමැතියකින් ආරම්භ වු පාඨමාලාව තුලින් 2016 වන විට වෛද්‍යවරු 2000කට වැඩි පිරිසකට ද්වි භාෂා ප්‍රවිණත්වය මෙම පාඨමාලාව මඟින් ලබා දි ඇත. සිංහල වෛද්‍යවරුන් 2000ක් පමණ පිරිසක් ද්‍රවිඩ භාෂාව හදාරා දැනට උතුරු නැගෙනහිර සහ වතුකරයේ රොහල් වල සේවය කරන අතර එම සිංහල වෛද්‍යවරුන් රෝගින්ගේ මවු භාෂාව භාවිතා කරමින් කතා කිරීම නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩිවීමට සහ ජාතින් අතර සංහිඳියාව ඇති කිරීමටද හේතු වු බවට එම ප්‍රදේශ වල ජනතාව සාක්ෂි දරයි. සීමාවාසික වෛද්‍යවරයා රෝගියකු හා මුලින්ම සම්බන්ධ වන පුද්ගලයාය (First contact person). සීමාවාසික වෛද්‍යවරයෙකු ද්වි භාෂා දැනුම ලබා ගැනිම මඟින් රෝගියාගේ මව් බසින්ම කතා කොට රෝගි විස්තර දැන ගැනිම සහ ඔහුට අවශ්‍ය උපදෙස් දිම මඟින් උසස් ගුණාත්මක ප්‍රමිතියකින් යුතු සෞඛ්‍ය සේවයක් ජාති භේදයකින් තොරව මුලු රටේම පවත්වා ගැනිමට මහෝපකාරි වන බව දේශිය මෙන්ම විදේශිය විද්වතුන්ද මෙම පාඨමාලාවට ප්‍රසංශා කරමින් ලිපි පල කර ඇත.

නමුත් 2016 වසරේ සිට සෞඛ්‍ය අමාත්‍යංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය අතර ඇතිව් තිබෙන කඹ ඇදිල්ලේ ප්‍රතිඵලයක් ලෙස ජාතික සංහිඳියාවේ මුලාරම්භය වු මෙම පාඨමාලව නැවති ඇත. අවසාන මාස අතර තුල කිසිම පාඨමාලවක් පැවති නැත. සීමාවාසික පත්වීම් බලාපොරොත්තුවෙන් දැනට වෛද්‍යවරුන් 1000ක් පමණ මෙම පාඨමාලාවට යාමට බලාපොරොත්තුවෙන් සිටිති. තව මාස 5ක් තුල ඔවුන් සීමාවාසික පත්වීමට යනවිට ඔවුන් මෙම භාෂා ප්‍රවිනත්වය ලබා නොතිබුණහොත් එය රටේම අවාසනාවකි. නමුත් සංහිඳියාව පිළිබඳව කතා කරන රටේ ප්‍රායෝගිකව සංහිඳියාව ඇතිකරන පාඨමාලාවන් නතරවි ඇත. සෞඛ්‍ය අමාත්‍යංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය සමඟ කෙතරම් සාකච්ජා කලද කටයුතු සිදු වන්නේ ඉතා මන්දගාමි ස්වභාවයෙන්ය.

කෙසේ වෙතත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා මෙම වැඩ සටහන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අනුමත කිරීමට අද පෙරවරුවේ එකඟ විය. එය ඉක්මනින් ක්‍රියාත්මක වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ස්තුතියි.

වෛද්‍ය නවින් ද සොයිසා
ලේකම්

වැඩි දුර විස්තර :
වෛද්‍ය සමන්ත ආනන්ද - 0777666301
වෛද්‍ය හරිත අලුත්ගේ - 0718121619
වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු - 0772604208